ET/SSS/2022(2023)/OL/33/S/A/S-4

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# History

# ඉතිහාසය



## Answer Sheet - I, II | පිළිතුරු පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

Nenasa
The National e-learning Portal for The General Education


දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

# I පත්‍රය


| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| **01** | 3 | **11** | 2 | **21** | 4 | **31** | 2 |
| **02** | 4 | **12** | 3 | **22** | 3 | **32** | 4 |
| **03** | 1 | **13** | 1 | **23** | 2 | **33** | 1 |
| **04** | 2 | **14** | 1 | **24** | 1 | **34** | 3 |
| **05** | 2 | **15** | 3 | **25** | 2 | **35** | 3 |
| **06** | 4 | **16** | 2 | **26** | 4 | **36** | 1 |
| **07** | 2 | **17** | 4 | **27** | 3 | **37** | 2 |
| **08** | 3 | **18** | 2 | **28** | 1 | **38** | 4 |
| **09** | 4 | **19** | 3 | **29** | 4 | **39** | 4 |
| **10** | 1 | **20** | 2 | **30** | 3 | **40** | 1 |

## II පත්‍රය
## I කොටස

**01. (අ) (I) සිතියමෙහි ලකුණු කර ඇත. (ලකුණු 1 x 12 - 12)**



**(II)** ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර ඇත. **(ලකුණු 1 x 6 -06 )**




**(ආ) (I) A - I** විජයබාහු රජු / මහා විජයබාහු රජු

**B -** පණ්ණසාලා

**C -** ඌරා කැට ළිං

**D -** නිශ්ශංක අලකේෂ්වර / නිශ්ශංක අලගක්කෝනාර

**(ලකුණු 1x4 - 04)**

**(II) 1.** ලෝහමය කතුරු / පැරණි කතුරු / ශල්‍යකර්ම සඳහා යොදා ගන්නා කතුරු

**2.** ආලාහන පිරිවෙන් භූමියෙන් / පොළොන්නරුවේ ආලාහන පිරිවෙන් භූමියෙන්

**3.** යකඩ / ලෝහ

**4.** රෝහල් සැත්කම සඳහා / ශල්‍යකර්ම සඳහා

**(ලකුණු 1x4 - 04)**

**(III) 1.** දහසය වන ලුවී රජු

**2.** ප්‍රංශය

**3.** බුර්බෝන් රාජවංශය

**4.** වර්සෙල්ස් මාලිගාව

**(ලකුණු 1x4 - 04)**

**02. (I) A -** රංවාමඩම, හල්දුම්මුල්ල, බෙරගල (මින් දෙකක්)

**B -** ඉබ්බන් කටුව, යටිගල්පොත්ත, ගල් සොහොන් කනත්ත (මින්එකක්) ( ලකුණු 03)

**(II)** * ආහාර පාන සඳහා අවශ්‍ය ස්වභාවික සම්පත් බහුල වීම.

* ගල් මෙවලම් තැනීම සඳහා අවශ්‍ය පාෂාණ වර්ග බහුල ප්‍රදේශ වීම.

*වර්ෂා කාලවල දී ජීවත්වීමට ගල්ගුහා බහුල ප්‍රදේශ වීම.

**(මින් පිළිතුරු දෙකට 2 x 2 - 4)**

(III) - සකපෝරුව භාවිතා කර මැටි බඳුන් නිපදවීම පිළිබඳව දැන සිටීම. උඩරංචාමඩම නිවාසයෙන් හමුවූ පින්තාරු කරන ලද මැටි බඳුන
- පොළොවට ලම්භාකාර ලෙස බිත්ති බැඳ නිවාස ඉදිකිරීමේ තාක්ෂණය දැනසිටීම.
- පබළු නිපදවීමේ තාක්ෂණය දැනසිටීම - නිවසේ තිබී හමු වූ මැටි පබළු -ලෝහ භාවිත පිළිබඳව දැන සිටි බව - කාන්තාවන් ඇස් අඳුන් ගැල්වීමට භාවිතා කළ ලෝහ කූර
-( කරුණු දෙකට ලකුණු 02- විස්තරයට ලකුණු 03 -05)

(IV) A ගම්

- වැසි ජලයෙන් පෝෂණය වූ කුඩා වැව් කේන්ද්‍ර කරගනිමින් ගංගාවල පිටාර නිම්නයට පිටතින් එකිනෙකට ස්වාධීන ව ව්‍යාප්ත වූ ජනාවාස වාපි ගාම යනුවෙන් හැඳින්වීම .
  උදාහරණ -සුමනවාපි, හුන්දරවාපි, කඩහවාපි, විහාරව්පි
- කැලෑ තීරයක් මගින් එක් ගමක් තවත් ගමකින් වෙන්වීම
- වෘත්තීන් අනුව හා කාර්යයන් අනුව ගම් වර්ග කිරීම.

B නගර

- ගමත් පුරයත් අතර වූ ජනාවාස "නකර" හෙවත් නගර යනුවෙන් පුරාණ සෙල්ලිපිවල සඳහන් වීම
- ගම්වල නිෂ්පාදනය කරන දැ වෙළඳාම පිණිස මහ නගර වෙත ගෙනයාම සම්බන්ධීකරණය කරන ලද්දේ මෙම අතරමැදි ජනාවාස වලිනි
- ගමකට වඩා ප්‍රමාණයෙන් මදක් විශාල වීම.

C පුර

- විශාල නාගරික ජනාවාස පුර යනුවෙන් හැඳින්වීම .
  උදාහරණ - අනුරාධපුර, මාගම්පුර
- ක්‍රිස්තු පූර්ව 250 දී ලියන ලද බ්‍රාහ්මී සෙල්ලිපියක නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා පුර කමත යන නමින් හඳුන්වා තිබීම.
- පනාකඩුව තඹ සන්නසෙහි අනුරාධපුරය නුරුපුර යනුවෙන් හඳුන්වා තිබීම.

**03.** (I) A - වංසත්ථප්පකාසිනි
B - ඉබන් බතූතා
C - ලෙන් ලිපි

**(ලකුණු 03)**

(II) - මූලාශ්‍ර රචනා වූ කාලය
- මූලාශ්‍රයේ කතුවරයා
- කතුවරයාගේ අරමුණ
- මූලාශ්‍රය සඳහා කරුණු සපයා ගත් ආකාර

**(ලකුණු 04)**

**(III)**

- සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් නොවන කරුණු අනාවරණය කර ගැනීමට.
- පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව,තාක්‍ෂණය, ගොඩනැගිලි නිර්මාණය, හෙවත් වාස්තු විද්‍යාව වැනි අංශ වල තොරතුරු ලබා ගතහැකිවීම.
- පැරණි ජනතාවගේ විවිධ හැකියා, කුසලතා, පැරණි සංස්කෘතිය, තාක්‍ෂණය, විදේශ සබඳතා හා ඔවුන්ගේ ජීවන ක්‍රමය ආදි අංශ රැසක් පිළිබඳ අවබෝධය ලබාගත හැකිවීම.
- පුරාවිද්‍යා මූලාශ්‍රය බොහෝ විට ඓතිහාසික සිදුවීම්වලට සමකාලීන වනනිසා සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු පුරාවිද්‍යාත්මක වශයෙන් සනාථ කරගත හැකිවීම.
- සාහිත්‍ය මූලාශ්‍රය වලට වඩා විශ්වාසදායී තොරතුරු ලබාගත හැකිවීම.
- සාහිත්‍ය මූලාශ්‍රයවල අඩු පාඩු පුරවා ගැනීමට මෙන් ම අලුත් තොරතුරු ලබා ගැනීමටද උපකාරීවීම.

**(ලකුණු 05)**

(IV)

- අපේ අතීත ශ්‍රී විභූතිය ඒවා තුළින් නිරූපණය වන නිසා අනාගත පරම්පරාවන්ට ඒවා දැක බලා ගැනීම සඳහා,
- අතීත ශිල්පීන් තාක්ෂණික හැකියාවන් ඒවා තුළින් පිළිබිඹු වන නිසා,
- විවිධ ජනකොටස් නොදැනුවත්කම නිසා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර විනාශ කිරීමට පෙළඹෙන බැවින් ඔවුන්ගෙන් ඒවා රැක ගැනීම සඳහා,

**(කරුණු දෙකට ලකුණු 02 විස්තරයට ලකුණු 04- මුළු ලකුණු 6)**

04 (I)

- රට ආර්ථික වශයෙන් දියුණු කිරීම.
- වැව් අමුණු ඉදිකර ආර්ථික සුභසිද්ධිය ඇති කිරීම.
- රට වැසියාට ආරක්ෂාව සැපයීම.
- පරසතුරු උවදුරු වලින් රට ආරක්ෂා කර ගැනීම.
- රටවැසියාගේ ආධ්‍යාත්මික සංවර්ධනය ගොඩනැංවීම.
- වෙහෙර විහාර ඉදි කරමින් ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම.

**(ලකුණු 03)**

(II) - ජලය සංරක්ෂණය කර ගැනීම
ඇළ දෙපස භූමියේ තෙතමනය ඉහළ දැමීම මඟින් බෝග වගාව වැඩිදියුණු කිරීම

(ලකුණු 2x2 -04)

(III)

- ශ්‍රී මහා බෝධි රෝපණ අවස්ථාවේදී කාචරගාම හා චන්දන ග්‍රාමයේ ක්ෂත්‍රියන්ට ආරාධනා කිරීම.
- ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම.
- අශෝක අධිරාජයා විසින් එවන ලද පංච කකුධ භාණ්ඩ භාවිත කොට නැවත රාජාභිෂේකය ලැබීම.
- දෙවනපිය යන අභිධානය භාවිතයට ගැනීම.

**( මින් කරුණු දෙකක් සඳහා ලකුණු 02, විස්තර කිරීමට ලකුණු 03-මුළු ලකුණු 05)**

(IV)

- සින්තාරු බිම් බුදල්නාගෙන් උපකාර ලබාගෙන සේනා සංවිධානය කිරීම.
- තෙවරක් අනුරාධපුරය ආක්‍රමණය කොට අවසාන සටනේ දී චෝලයන්ගෙන් අනුරාධපුර රාජධානිය මුදාගෙන නැවත රට එක්සේසත් කිරීම.
- පාලන මධ්‍යස්ථානය පොළොන්නරුවට මාරු කිරීම.
- බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.
- රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම.

**(කරුණු තුනට ලකුණු 03, විස්තරයට ලකුණු 03,මුළු ලකුණු 06)**

**05** (I) **මින්නේරිය වැව, ගිරිතලේ වැව, කන්තලේ වැව, කවුඩුල්ල වැව**

**( නිවැරදි පිළිතුරු 3තුනකට ලකුණු 03)**

(II)

A. පීඩන ශල්කනය
B. අඩික
C. පරමාණුව
D. කටාරම

(III)

- වැඩිවන ජනගහණයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය ඉහළ දැමීම.
- ආහාර සඳහා වෙනත් රටවල් වලින් ඇති ඉල්ලුම සපුරාලීම.
- කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීම.
- ගංවතුර පාලනය කිරීම.
- නාගරික ජනතාවගේ වෙනත් වශ්‍යතා සම්පූර්ණ කිරීම.

(IV)

A- සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ සමනල වැව ප්‍රදේශය.
මධ්‍යම පළාතේ සීගිරිය අළකොල වැව දෙහිගහ ඇලකන්ද ප්‍රදේශය.

(ලකුණු 02)

B - සමනලවැව යකඩ නිස්සාරණය
ස්වාභාවික සුළං බලය යොදා ගැනීම.
ලිමොනයිට් සහ හෙමටයිට් යන ගල් විශේෂය යොදා ගැනීම.
මරං නම් ශාකය (යකඩමරං) පුළුස්සා ලබාගත් අඟුරු උඳුන් දැල්වීම සඳහා යොදාගැනීම.

- අළකොලවැව යකඩ නිස්සාරණය සඳහා මයිනහමක් වැනි උපකරණයක් යොදාගැනීම.

( ලකුණු 04)

**06** (I) සෙංකඩගල නුවර, උඩරට රාජධානිය, කන්දෙ නුවර

( ලකුණු 03)

(II) A සේනාසම්මත වික්‍රමබාහු
B වීරසුන්දර බණ්ඩාර
C කටුපුල්ලේ වරු
D යමසිංහ බංඩාර

(ලකුණු 04)

(III) -ගැටුම්වලින් වැළකී උඩරට සමඟ සාමකාමීව කටයුතු කිරීමට ලන්දේසින් උත්සාහ කිරීම
- උඩරට රජුගේ හොඳ හිත දිනා ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම උදාහරණ
* රජුට තෑගි බෝග ලබාදීම.
* රජු හමුවීමට දූත පිරිස් යැවීම.
* රජු සමග ලිපි හුවමාරු කරගැනීම.
- උපසම්පදාව ගෙන ඒම සඳහා උඩරට රජවරුන්ට නැව් සපයාදීම.
උදාහරණ II විමලධර්මසූරිය රජු, කීර්ති ශ්‍රී රාජසිංහ, ශ්‍රී විජය රාජසිංහ වැනි රජවරුන්ට නැව් ලබාදීම.

**( කරුණු දෙකකට ලකුණු 02, විස්තරයට ලකුණු 03, මුළු ලකුණු 05)**

(IV) වර්ධනයට බලපෑම් ආකාරය,

- මුල්ලේරියා සටනේදී පෘතුගීසීන් සමූල ඝාතනය කිරීම් තුළින් පෘතුගීසීන්ගේ බලය අඩපණ කිරීම.
- වීරසීරසුන්දර බණ්ඩාරගේ සහය ලබා ගනිමින් උඩරට රාජධානිය අත්පත් කරගෙන කෝට්ටේ බල ප්‍රදේශය පුළුල් කර ගැනීම.

පරිහානියට බලපෑ හේතු,

- සීතාවක පාලකයන් නිරන්තර යුද්ධයක නියැලීම නිසා ආර්ථික සංවර්ධනය බිඳවැටීම.
- රාජසිංහ රජු අවසන් කාලයේ දී අනුගමනය කළ බෞද්ධ විරෝධී ප්‍රතිපත්තිය
- උඩරට යටත්ව කර ගැනීමේදී උදව් කළ වීරසුන්දර බණ්ඩාර ඝාතනයට ලක් කිරීම නිසා උඩරට ජනතා සහය නොලැබීම.
- කොනප්පු බණ්ඩාර උඩරට රජවීම සහ ඔහු සමඟ ඇති වූ යුද ගැටුම්වලින් පරාජයට පත්වීම.
- රාජසිංහ රජුගෙන් පසු සීතාවක රාජධානියට නිසි උරුමකරුවෙකු නොසිටීම.

**(වර්ධනයට හා පරිහානියට බලපෑ සාධක තුනක් නම් කිරීමට ලකුණු 03,විස්තරයට ලකුණු 03)**

07 (I) A - මදුරාසිය ,බොම්බාය, කල්කටාව (මින් දෙකක්)
B පොන්ඩිචේරි, කරිකාල්, චන්ද්‍රනගර් ( මින් එකක් ) (ලකුණු 03)

(II)

- වැසි සමය එළඹීමත් සමඟ සැපයුම් මාර්ග අවහිර වීම.
- පහත රට හා උඩරට අතර සැපයුම් මාර්ග උඩරටියන් විසින් අවහිර කිරීම.
- උඩරට පිළිබඳ නිවැරදි අවබෝධයක් ඉංග්‍රීසීන්ට නොතිබීම.
- උඩරට භික්ෂූන් වහන්සේ, රදලයන් සහ මහජනතාව රජුට පක්ෂපාතී වීම.

(මෙම කරුණුවලින් දෙකකට 2 x 2 ලකුණු 4)

(III) නිදහස් අහිමි වීම හා රජෙකු නොමැති වීම පිළිබඳ ඇතිවූ පසුතැවිල්ල.
ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවීම.
උඩරට ප්‍රභූ පංතියට පහර වැදීම.
( කරුණු දෙකකට ලකුණු 02, විස්තරයට ලකුණු 03 මුළු ලකුණු 05)

(IV) රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය.
ගම් සභාව අඩපණ වීම.
කෝල්බෲක් හඳුන්වාදුන් නව අධිකරණ ක්‍රමය.
( කරුණු තුනකට ලකුණු 03, විස්තරයට ලකුණු 03 ලකුණු 06)

III කොටස

08 (I) ජෝන් වයික්ලිෆ්, ජෝන් හස්, ඉරාස්මස්, මාටින් ලූතර්
(මින් තුනකට ලකුණු 03)

(II) A- ජාතික රාජ්‍යයන් අනුග්‍රහ දැක්වීම. ( රාජ්‍ය අනුග්‍රහය )
- කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන් අල්ලාගැනීමත් සමඟ පෙරඅපරදිග වෙළෙඳාමට බාධා ඇතිවීම.
- යුරෝපයේ පැවති ආගමික ගැටුම්.

B- මාලිමා යන්ත්‍රය නිපදවීම.
- උතුරු තරු මාපකය නිපදවීම.
- ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම.
-ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝක පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම.

(කරුණු 4 කට ලකුණු04)

(III)
-දේශ ගවේෂණය නිසා නව රටවල් සොයා යෑම.
-ආසියා අප්‍රිකා හා ඇමරිකා මහද්වීපවල යුරෝපා බල ව්‍යාප්තියක් ඇති වීම.
-යුරෝපා චින්තනය ලෝකය තුළ වූ ව්‍යාප්ත වීම.
-යුරෝපීය වාස්තු විද්‍යාව හා කලා ශිල්ප ලෝකය පුරා ව්‍යාප්ත වීම.
- ක්‍රිස්තියානි ආගම ලොව පුරා ක්‍රියාත්මක වීම.
- යුරෝපීය විද්‍යාත්මක දැනුම හා වාස්තු විද්‍යාව ලොව පුරා ව්‍යාප්ත වීම.
(කරුණු 2කට ලකුණු 02 විස්තරයට ලකුණු 3 යි ,මුළු ලකුණු 05 )

(Iv) දේශපාලන ක්ෂේත්‍රය.
ජාතික රාජ්‍යයන් බිහි වීම.
නව මධ්‍යම පන්තියක් බිහි වීම.
ඉඩම් හිමි වංශාධිපතිවරුන්ගේ බලය බිඳවැටීම.
රජු පාලන කටයුතුවල දී වැදගත් වූ අතර සියලු බලතල රජු වටා කේන්ද්‍රගතවීම.

09 (I) සීනි පනත මුදල් නෝට්ටු පනත මුද්දර පනත

(ලකුණු 03)

(II) A ප්‍රංශ මහා බ්‍රිතාන්‍යය රුසියාව ඇමරිකා එක්සත් ජනපද ජනපදය

(ලකුණු 02)

B ජර්මනිය, ඕස්ට්‍රියාව, තුර්කිය, බල්ගේරියාව, හන්ගේරියාව (ලකුණු 02)

(III) - බූර්බෝන් රාජවංශයේ පාලකයන්ගේ අත්තනෝමතික පාලනය.
- රජු ඇතුළු රජ පවුල ගත කළ අති සුඛෝපභෝගී ජීවිතය.
- රජු හා සාමාන්‍ය ජනතාව අතර සම්බන්ධතා දුරස්වීම.
- ස්ටේට්ස් ජනරල් සභාව අකර්මණ්‍ය වීම.

(කරුණු දෙකට ලකුණු දෙකයි විස්තරයට ලකුණු තුනයි මුළු ලකුණු පහයි)

(IV)- වෛමාර් සමූහාණ්ඩුවට විරුද්ධව කුමන්ත්‍රණ සිදු කිරීම.
- මගේ සටන නම් කෘතිය තුළින් නට්සිවාදී අදහස් පතුරවමින් ජර්මනිය තුළ ජාතිවාදය ව්‍යාප්ත කිරීම.
-එස් එස් හමුදාව හා ගෙස්ටාපෝ නම් රහස් පොලිසිය යොදා ගනිමින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස අහිමි කිරීම.
-ජාතීන්ගේ සංගමයෙන් ජර්මනිය ඉවත් කර ගැනීම හා නැවත යුද්ධයක් සඳහා මෙහෙයවීම.
වෙකොස්ලොවැකියාව ආක්‍රමණය කිරීම.
- හිට්ලර් විසින් පෝලන්තය ආක්‍රමණය කිරීම.

(කරුණු තුනට ලකුණු තුනයි විස්තර ලකුණු තුනයි මුළු ලකුණු හයයි)

*****